---

# කන්දකැටිය ප්‍රාදේශීය සභාව
# බදුල්ල දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 05 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු සමාලෝචිත වර්ෂයේ දායකය වූ රු.33,280 ක් සහ පෙර වර්ෂවලට අදාල රු.807,163 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම රු.33,280 ක් අඩුවෙන්ද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදලේ ශේෂය රු.840,443 ක් වැඩියෙන් ද ණයහිමියන් රු.840,443 ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුම්වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළ හැකි වටිනාකම රු.327,964 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 101,358 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 881,772 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 454 | 556 | 583 |
| (ii) | බදු කුලී | 1,103 | 1,874 | 141 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 258 | 402 | 8 |
| (iv) | වෙනත් ආදායම් | 182 | 121 | - |

### 2.2.2 බලපත්‍ර ගාස්තු

(අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ව්‍යාපාර ආදිය සමීක්ෂණයක් මඟින් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපාර ආයතන වර්ග 03 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,659,008 |
| (ii) | මුද්දර ගාස්තු | 43,221 |

---

**2.2.4 කඩ බදු**

පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කඩ කාමර සඳහා මාසික බදු කුලිය රජයේ ප්‍රධාන තක්සේරු කරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවෙකු මගින් තක්සේරු කරවාගත යුතුය. එම තක්සේරු කුලී අවම වශයෙන් වසර 5 කට වරක් වත් සංශෝධනය කළ යුතු වුවද, සභාව සතු කන්දකැටිය හන්දියේ පවතින කඩ කාමර 05 ක් සහ පොළ භූමියේ පිහිටි කඩ කාමර 03 ක් සඳහා එවැනි තක්සේරුවක් සිදු කර නොතිබුණි. බදු මුදල් කාලීනව සංශෝධනය නොකර 2005 වර්ෂයේ තක්සේරු කළ මාසික බදු කුලි පදනම් කරගෙන 2012 වර්ෂයේ දීද බිල් කරමින් පැවතුනි.

**2.2.5 වෙනත් ආදායම්**

සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ත්‍රීරෝද රථ ගාල් හතරක් ලියා පදිංචි කර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 **අවිධිමත් ගනුදෙනු**

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:1 උප වගන්තිය ප්‍රකාරව සභා ලේකම් තනතුරේ වැඩබැලීම වෙනුවෙන් වැඩ බැලීමේ වැටුප ගණනය කර ගෙවිය යුතු නිලධාරියෙකු වෙත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ වැටුප ගණනය කිරීම හේතුවෙන් 2011 ජුල මස සිට 2012 සැප්තැම්බර් මාසය දක්වා කාලය සඳහා රු.57,881 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

2.4 **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ප්‍රජා පාදක සංවිධාන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමේ දී එම සංවිධානවලට කොන්ත්‍රාත් කිරීමට ඇති හැකියාව හා මූල්‍ය ශක්‍යතාවය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් වරයාගෙන් සමන්විත කමිටුවක් මගින් සනාථ කර නොගෙන ග්‍රාම සංවර්ධන නිලධාරිවරයාගේ අනුමැතිය යටතේ රු. 1,564,699 ක වටිනාකමට කොන්ත්‍රාත් 03 ක් පිරිනමා තිබුණි.

(ආ) ඌව පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර, පරිසර හා සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ 2011 වර්ෂයේදී රු.182,284 ක වියදමක් දරා ලොග්ගල්ඔය අසල ඉදිකරන ලද තාවකාලික ගිමන්හල් දෙක ප්‍රයෝජනයට ගත නොහැකි අන්දමින් විනාශ වී තිබූ බව 2013 මාර්තු 07 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

## 2.5 මෙහෙයුම් /කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2007 වර්ෂයේ දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් සභාවට ලබාදී තිබූ විදුලි ජනක යන්ත්‍රය 2011 වර්ෂය අවසානයේ සිට ක්‍රියා විරහිතව පවතින අතර, එය අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර සභා භූමියේ නිෂ්කාර්යව රඳවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රු.77,052 ක් වටිනා තැන්පත් 22 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ අවස්ථා 14 කදී ඉන්ධන සඳහා ලබාදී තබුන අත්තිකාරම් රු.201,959 ක් 2013 මාර්තු මාසය වන විටද ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පියවාගෙන නොතිබුණි.

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල පනතේ 10 වගන්තිය ප්‍රකාරව සභාවේ සේවයේ නියුතුව සිටි අනියම් / ආදේශක සේවකයින් වෙනුවෙන් 2008 වර්ෂයේ සිට සේවක වැටුපෙන් අඩුකළ දායක මුදල් රු.422,499 ක් එම අරමුදල වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) 2012 වර්ෂය සඳහා සභාව විසින් සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාර සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඊ) සභාව විසින් පිළියෙල කරන ලද පුරවැසි ප්‍රඥප්තිය යාවත්කාලීන කර නොතිබුණි.

## 2.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් ක්‍රියාත්මක නොවන අතර, ප්‍රාදේශීය සභාව මගින් දෛනිකව එකතු කරනු ලබන කැලි කසල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ඉඩමකට බැහැර කරමින් පැවතුනි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය